## 6. තොරතුරු ඔබ සතුයි. නමුත් ඔබ ඒවා ලබාගන්නේ කෙසේද?

පුරවැසියන්ට ආණ්ඩුවෙන් තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය ආරක්ෂා කෙරෙන ''තොරතුරු නිදහස'' පිළිබඳ නීති ඇතැම් රටවල ඇත. සමහර රටවල ව්‍යවස්ථාවෙන් මේ අයිතිය ලබා දී ඇත. මහජනතාවට පුද්ගලික තොරතුරු, පාරිසරික තොරතුරු ආදී විශේෂිත තොරතුරු ලබා ගැනීමට හැකි වන පරිදි සකස් කළ නීති ඇතැම් රටවල ස්ථාපිත කර ඇත. උදාහරණයක් ලෙස චිලී රටේ සහ බොහෝ යුරෝපීය රටවල මිනිසුන්ට පරිසරයට අදාළ තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය තහවුරු කෙරෙන නීතියක් ඇත. කෙසේ වෙතත් ආණ්ඩුව තොරතුරු හෙළිදරව් කරන බව සහතික කරගැනීමට ඇති හොඳම විදිය නම් පුරවැසියාට තොරතුරු ලබා ගැනීමට ඇති නිදහස පිළිගන්නා සහ එසේ තොරතුරු ලබා ගත හැක්කේ කෙසේ කොතනින්ද යන්න නිශ්චිතව සඳහන් වන නීතියක් සම්මත කර ගැනීමෙනි. කිසියම් කෙනකු ඉල්ලා සිටියත් නැතත් ආණ්ඩුව විසින් සෑම අවස්ථාවකම ස්වේච්ඡාවෙන්ම අනාවරණය කළ යුතු තොරතුරු මොනවාද යන්නත් මේ නීතියේ අතුළත් විය යුතුයි.

## ඔබත් අදම ක්‍රියාත්මක වෙන්න!

තොරතුරු වෙත ඇති අයිතිය ආරක්ෂා කෙරෙන නීතියක් සම්මත කරන ලෙස ආණ්ඩුවට බල කළ හැකි විධි ගණනාවක් වෙයි. මේ ගැන මහජනතාව දැනුවත් කිරීම පළමු පියවරයි. ඔබ විසින් කළ යුතු වැදගත්ම දෙයක් වන්නේ ඔබේ මිතුරන්, සේවා ස්ථානයේ සගයන්, පවුලේ සාමාජිකයන් සමග මේ ගැන සාකච්ඡා කිරීමත්, තොරතුරු ලබා ගැනීමේ අයිතියක් ඔවුන්ට ඇතිය යන්න පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමත්ය. ඔබට හැකි සෑම ආකාරයෙන්ම ඔබේ අදහස් ප්‍රකාශ කරන්න. ඒ සෑම අදහසකටම වටිනාකමක් ඇත. එසේම ඔබ,

- *ආණ්ඩුවේ ආයතනවලට කතා කරන්නඃ* ආණ්ඩුව සහ මහජන ආයතන මහජනතාව වෙත තොරතුරු ලබා දිය යුතු බව සහතික කෙරෙන නීති රීති සම්මත කරන ලෙස ඔබේ කොට්ටාසයේ මන්ත්‍රීවරයාට බල කරන්න. ඡන්ද දායකයන්ගේ තොරතුරු වෙත ඇති අයිතිය ආරක්ෂා කිරීමට දැනට ඔවුන් ගෙන ඇති පියවර මොනවාදැයි ඔවුන්ගෙන් අසන්න.

- *දේශපාලන නායකයන්ට බලපෑම් කරන්නඃ* තොරතුරු වෙත ඇති මහජන අයිතිය පිළිබඳ දේශපාලකයන්ට මතක් කරවීමට හැකි හොඳම කාලය මැතිවරණ සමයයි. තොරතුරු වෙත ඇති නිදහස කෙතරම් වැදගත්ද යන්න ඔවුන්ට ඒත්තු ගන්වන්න. එසේම එය මැතිවරණ පොරොන්දු අතරට එක් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

- *පුවත්පත්වලට, ගුවන්විදුලියට සහ රූපවාහිනී නාලිකා වලට කතා කරන්න* : තොරතුරු වෙත ඇති අයිතිය කෙතරම් වැදගත් ද යන්න මාධ්‍යවේදීහු දනිති. මන්ද යත්, ඔවුන්ට ඔවුන්ගේ වෘත්තිය කරගෙන යාම සඳහා නිවැරදි තොරතුරු ලබා ගැනීමට ඇති නිදහස පැවතීම අත්‍යවශ්‍ය වන හෙයිනි. එහෙයින් මේ පිළිබඳ පණිවුඩය ව්‍යාප්ත කිරීමට සහ අලුත් නීතියක් ඇති කරගැනීමට ඔවුන්ගේ සහයෝගය ලබා ගන්න.

- *ප්‍රජා කණ්ඩායම් සමග එක්ව වැඩ කරන්නඃ* තොරතුරු නිදහස ආරක්ෂා කෙරෙන නීතියක් සම්මත කර ගැනීම වෙනුවෙන් උද්ඝෝෂණය කරන කණ්ඩායම් දැනටමත් ඔබේ ප්‍රදේශයේ සිටී ද යන්න සොයා බලන්න. ඔබේ පාලකයන්ට දැනෙන බලපෑමක් කළ හැකි ආකාරයේ ප්‍රබල හඬක් නගන්න. තොරතුරු නිදහස වෙනුවෙන් උද්ඝෝෂණය කරන එවැනි කණ්ඩායමක් නැතිනම් එවැන්නක් ඇති කිරීමට ඔබට මුල් විය හැකියි. එසේම මේ ගැන ඔබේ සේවා ස්ථානයේදීත්, පන්සලේ පල්ලියේදීත්, ඔබේ දරුවාගේ පාසලේදීත් එකිනෙකා සමග කතා කරන්න.

### පහසුකම් නැති අලුත් ජනාවාස

දැන් මෙරට හැම තැනකම ඉඩම් කට්ටිකර විකුණනවා. අක්කර 20-30 පොල්වතු මෙලෙස පර්චස් විස්සේ කුඩා කැබලි බවට පත් වෙනවා. අක්කර 08කට වැඩි ඉඩමක් කැබලි කර විකුණනවා නම් එහි ආගමික ස්ථාන සදහා මෙන්ම පොදු කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීම අවශ්‍ය යි. විශේෂයෙන්ම ක්‍රීඩා කිරීම සඳහා. මේ නිසා ඉඩම් හිමියන් කරන්නේ අක්කර 7 බැගින් දෙතුන් වරකට හෝ වෙන් වෙන් වශයෙන් ඉඩම් කට්ටි කර විකිණීම. එවිට අක්කර 20ක් බෙදා වෙන් කළත් පවුල් 200ක් එහි වාසයට පැමිණියත් කිසිම පොදු කටයුත්තක් සඳහා ඉඩමක් ලැබෙන්නේ නැහැ.

එම අවස්ථාවේදීම අදාළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාටත් එහි සභාපතිවරයාටත් ඉඩම් කට්ටි දෙකක් ලැබීමට හොදටම ඉඩ තිබෙනවා. එමගින් මහාජනයාගේ අයිතිය යටපත් වෙනවා. ප්‍රදේශීය සභාවක බලප්‍රදේශයේ කොතරම් ඉඩම් කට්ටි කර විකුණනවාද? එම ඉඩම් කට්ටි කිරීමේ දී නිසි ලෙස පාරවල් යනාදිය යොදා තිබේද? පොදු කටයුතු සඳහා ඉඩම් වෙන් කර ඇත් ද කියා අප දැන ගන්නේ කෙසේද? එම ප්‍රශ්නයට පිළිතුරක් ප්‍රාදේශීය සභාවෙන් දැන ගැනීමේ ක්‍රමයක් අපට නැහැ.

අප එය ඇසුවද පිලිතුරක් ලැබේ යැයි විශ්වාස කරන්න බැහැ. එවැනි තොරතුරු ඉල්ලා සිටීමට නිසි ක්‍රමයක් නැහැ.

එවැනි තොරතුරු ලබා ගැනීමේ සරල ක්‍රමයක් අපට තිබුණා නම් අද මෙසේ ඉඩම් කට්ටිවල ජීවත් වන ජනයාට වඩා හොද පහසුකම් ලබා ගැනීමට ඉඩ තිබුණා. නමුත් රට පුරාම ප්‍රාදේශීය සභා මෙම යුතුකම බොහෝ දුරට පැහැර හරිනවා. ඊට ඉඩ සැලසී ඇත්තේ පුරවැසියන් වන අපේ උනන්දුවක් නැති නිසා.

In partnership with:

Friedrich-Naumann-Stiftung für die Freiheit
USO House
6, Special Institutional Area
New Delhi 110067, INDIA
Tel.: +91-11-2686 2064/ 2686 3846
Fax.: +91-11-2686 2042
Mobile: +91-9958207765
Websites: www.southasia.fnst.org
www.stiftung-freiheit.org

මාධ්‍ය ඒකකය - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
24/2, 28 වෙනි පටුමග, මල්පාර,
කොළඹ 07, ශ්‍රී ලංකාව
දුරකථන : + 94-11-2301634, 2565304-6, 94-11-5552746/8
ඊමේල් : info@cpalanka.org
වෙබ් අඩවිය : http://www.cpalanka.org

Published by:

**Commonwealth Human Rights Initiative**
B-117, Sarvodaya Enclave
New Delhi - 110 017, INDIA
Tel: +91-11-26864678, 26850523, 26528152
Fax: +91-11-26864688
E-mail: chriall@nda.vsnl.net.in
Website: http://www.humanrightsinitiative.org

# තොරතුරු දැනගැනීමට ඔබට අයිතියක් ඇත



## ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහභාගී වීමට ඔබට ඇති යතුර තොරතුරුයි.

ප්‍රජාතන්ත්‍රවාදය යනු රටේ ආණ්ඩුකරණ ක්‍රියාවලිය කෙරෙහි ඔබත් සහභාගී වීමයි. එසේ සහභාගී වීම සඳහා ආණ්ඩුවේ ක්‍රියාකාරකම් පිළිබඳව ඔබ දැනුවත් වීම අවශ්‍යයයි. ආණ්ඩුවේ ආයතන සතු තොරතුරු ඔබට ලබා ගත හැකි බවට වගකීම් සහතිකයක් අවශ්‍යයයි.

## ආණ්ඩුව මේ දේවල් ඔබට හෙළිදරවු කළ යුතුයි කියා සිතෙන්නේ නැද්ද?

- ⌘ ඔබේ එදිනෙදා ජීවිතයට බලපාන ආණ්ඩුවේ තීරණ සහ ක්‍රියාකාරකම්
- ⌘ ඔබේ ප්‍රදේශයේ පාසල සහ සෞඛ්‍ය සායනයේ කටයුතු පිළිබඳ වගකීම් පවරා ඇති පුද්ගලයින්ගේ නම් මොනවාද?
- ⌘ ඔබේ ප්‍රදේශය අවට මහා මාර්ග ඉදිකිරීම සහ අලුත්වැඩියාව සඳහා කෙතරම් මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇති ද?

### ආණ්ඩුවෙන් තොරතුරු ලබාගැනීමට ඔබට අයිතියක් ඇත

ආණ්ඩුව බලයට පත් වී ඇත්තේ ඔබේ ඡන්දයෙන්. මහජන සුබසාධන වැඩසටහන් සඳහා යොදාගන්නේ ඔබ ගෙවන බදු මුදල්.

ඔබ විසින් බලයට පත් කළ, ඔබේම මුදලින් නඩත්තු වන / ක්‍රියාත්මක වන ආණ්ඩුව තමන් කරන්නේ මොනවාද කියාත්, එසේ කරන්නේ ඇයි ද කියාත් ඔබට හෙළි කළ යුතුයි නේද?

## තොරතුරු වෙත ඇති අයිතිය යනු කුමක්ද?

''තොරතුරු නිදහස'', ''තොරතුරු වෙත ප්‍රවේශවීමේ හැකියාව'', එසේත් නැතිනම් ''තොරතුරු දැනගැනීමට ඇති අයිතිය'' යන නොයෙක් යෙදුම් ඔබ අසා ඇති.

ඒ හැමෙකකම අදහස එකමය.

ආණ්ඩුව වැඩ කරගෙන යාමේදී රට පිළිබඳවත්, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් මොනවාද යන්න පිළිබඳවත්, මහජන මුදල් වියදම් කරන්නේ කෙසේද යන්න පිළිබඳවත් බොහෝ තොරතුරු රැස් කර ගනියි. තවද ආණ්ඩුව තනි තනි පුද්ගලන් ගැන ද තොරතුරු එකතු කර තබා ගනියි.

මේ තොරතුරු සෑම දෙනෙකුටම ප්‍රයෝජනවත් විය හැකි මහජන සම්පතකි. නමුත් ඇතැම් අවස්ථාවලදී ආණ්ඩුවෙන් මේ තොරතුරු ලබා ගැනීම ඉතාම දුෂ්කර වෙයි. ආණ්ඩු වඩා කැමති වන්නේ තමන් වෙත ඇති තොරතුරු රහසිගතව තබා ගැනීමටයි. නමුත් සිදු විය යුත්තේ මෙය නොවේ.

තමන්ගේ ආණ්ඩුව සහ අනෙකුත් මහජන ආයතන වෙතින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ මුදල් විය හියදම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට සෑම පුරවැසියෙකුටම මානව අයිතිවාසිකමක් ඇති බව ලෝකය පුරා රටවල් ගණනාවක් විසින් පිළිගෙන තිබේ.

එකී තොරතුරු හෙළි කිරීමෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති විම හෝ යමෙකුගේ පෞද්ගලික රහස්‍යභාවය උල්ලංඝණය වීම වැනි බරපතල හානියක් ඇති නොවන්නේ නම් මහජනයා වෙත මේ තොරතුරු ලබා දීමට වගකීමක් ආණ්ඩුවට ඇත.

## තොරතුරු වෙත ඇති අයිතිය වැදගත් වන්නේ ඇයි?

ආණ්ඩුවේ තොරතුරු ලබා ගත හැකි නම්, මැති ඇමතිවරුන් කරන්නේ මොනවාද යන්න ගැන ඔබට මනා අවබෝධයක් ලබා ගත හැකියි. එසේම ඔවුන් ඡන්ද කාලයේදී දුන් පොරොන්දු ඉටු කරනවාද නැද්ද යන්න පිළිබඳ සොයා බැලීමටත් හැකියි.

තොරතුරු වෙත ඇති අයිතිය පාවිච්චි කිරීමෙන් ලැබිය හැකි යහපත් ප්‍රතිඵල බොහොමයක් තිබේ.

### 1. නියම තොරතුරු දන්නේ නම්, මැතිවරණයකදී

දේශපාලනඥයන්ගේ ක්‍රියාකාරකම් ගැන එහෙන් මෙහෙන් ඇහෙන දේ මත රඳා නොසිට, තමන් ඡන්දය දිය යුත්තේ කාටද, කුමන දේශපාලන පක්ෂයටද, යන්න පිළිබඳව දැනුවත් තීරණ ගැනීමට ඔබට හැකියාව ලැබෙයි. එසේම මහජන නිලධාරීන් බලයට පත් වූ පසු ගන්නා තීරණ, ක්‍රියාමාර්ග, සහ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔවුන් වගකීමෙන් බැඳ තැබීමටත් ඔබට තොරතුරු වෙත ඇති අයිතිය යොදාගත හැකියි. තමන් මුදල් වියදම් කරන්නේ මොනවාටදැයි ආණ්ඩුව ඔබට කිව යුතු නම් ඒ මුදල් යොදවා ක්‍රියාත්මක කෙරෙන පාසල්, සෞඛ්‍ය ආදී සේවාවන්ගෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි ඔබටම කිරා මැන බැලිය හැකියි. ඒවා වෙතින් ඔබට ලබාදෙන සේවාව පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම් සිදුවිය යුතු වෙනස්කම් මොනවාද යන්න ඔබට ආණ්ඩුවට දන්වා සිටිය හැකියි. එසේම නව ප්‍රතිපත්ති සැලසුම් කිරීමටත් ඒවා ක්‍රියාවේ යෙදවීමටත් ඔබගේ සහයෝගය ලබා දිය හැකියි.

### වකුකඩු රෝගය රහසිගත වීම

රසිකා ප්‍රියදර්ශනී වන මම 2007 අගෝස්තු මාසයේ දී වකුගඩු රෝගීන් ගැන තොරතුරු ලබා ගන්න අනුරාධපුර රෝහලට ගියා. උතුරු මැද පලාතේ දැනට වකුගඩු රෝගීන් 30,000 ට ආසන්න පිරිසක් සිටින බවට මට තොරතුරු ලැබී තිබුනා. ඒ ගැන මෙන්ම මෙම තත්ත්වයට පිළියම් ලෙස කළ හැක්කේ මොනවාද යන්න ගැන ප්‍රදේශයේ ජනයා දැනුවත් කළ යුතු යයි සිතූ නිසා නිවැරදි නිල විස්තර දන ගැනීමට මා වකුගඩු ඒකකය බාර නිලධාරියා හමු වීමට ගියා. නමුත් ඔහු එක පාරටම කඩාපැන තොරතුරු දෙන්න බැරි බව කීවා. ඔයා කව්ද? ඔයාට මොකටද තොරතුරු අවශ්‍ය වෙන්නෙ? ඔයා මොන සංවිධානයෙන් ද? යනාදී ප්‍රශ්න රාශියක් මගෙන් එක දිගට අහගෙන අහගෙන ගියා. ඒ තොරතුරු අවශ්‍ය නම් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගෙන් අනුමැතිය අරන් එන ලෙස මට දැන්වූවා. එහෙම නැතිව තොරතුරු කිසිවක් දෙන්න බැහැයි කීවා.

ඊළඟ සිකුරාදා මේ සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙක් රෝහලට ඒමට නියමිත බව මා දනගෙන සිටියා. මා එම වෛද්‍යවරයාගේ දුරකථන අංකය ඉල්ලා සිටියා. එවිට මට දුන් පිළිතුර වූයේ එයාලා ලොකු මිනිස්සු, එයාලගෙ පුද්ගලික තොරතුරු දෙන්න බැහැ කියලයි. මා කරන්න දෙයක් නැතිව ආපසු හැරිල ආවා.

මට හිතා ගන්න බැරි රෝගීන් 30,000 ක් මැරෙන්න ඉන්න වෙලාවෙ මොන කෙහෙල් මලකට ද මේ තොරතුරු හංගන්නේ කියල යි.

*විකල්ප පුරවැසි වෙබ් අඩවියෙන් උපුටා ගැනුණි.*

### 2. ඔබට වඩා හොඳ පහසුකම් ඉල්ලා සිටිය හැකියි

ඔබ වෙනුවෙන් ඇති පොදු පහසුකම් වල තත්ත්වය ඉහළ නංවාගැනීම සඳහා ඔබටත් ඔබේ ප්‍රජාවටත් විශාල බලපෑමක් කළ හැකියි. ඔබට ප්‍රයෝජනවත් වන ප්‍රජා සේවාවන් සහ ව්‍යාපෘතීන් පිළිබඳ තොරතුරු ආණ්ඩුව ස්වේච්ඡාවෙන්ම හෙළි දරවු කළ යුතුයි. එනම් ආණ්ඩුව දැනට පවත්වාගෙන යන සහ අලුතෙන් ඉදිකරන පාසල්, රෝහල්, මහාමාර්ග, සෞඛ්‍ය සේවා පහසුකම් සහ සුබ සාධන වැඩසටහන් වලට අදාළ තොරතුරු නිතර නිතර ප්‍රකාශයට පත් කළ යුතුයි. කියන පරිදි මේ සේවාවන් සැබැවටම ක්‍රියාත්මක වන්නේද නැද්ද යන්න පිළිබඳව එවිට ඔබට තහවුරු කරගත හැකි වෙයි. එසේම ඒවා පොරොන්දු වූ ප්‍රමිති තතත්වයට නැති විට වඩා හොඳ සේවාවක් වෙනුවෙන් හඬ නැගිය හැකියි.

### 3. ඔබේ රට ස්ථාවර, ආරක්ෂිත බිමක් බව තහවුරු කරගන්න.

ආණ්ඩුව පුරවැසියන් වෙනුවෙන් ඉටු කරන්නේ මොනවාදැයි දැනගැනීමට ඔබට හැකිනම් එය රටේ දේශපාලන ස්ථාවරභාවය ශක්තිමත් වීමට හේතුවක් වනු ඇත. ආණ්ඩුව ඔබේ අවශ්‍යතා සහ අදහස්වලට ගරු කරන විට ඔබ සහ ආණ්ඩුව අතර ඇති පරතරය අහෝසි වී යනු ඇත. එසේම තොරතුරු නිදහස ඇති විට ආණ්ඩුවේ තීරණ සම්බන්ධයෙන් සුළුජාතීන්ගේ ද දායකත්වය ලැබෙන බව සහතික කර ගැනීමට හැකි වන අතර, තමන්ගේ හඬ වසා දමා නැති බව එවිට ඔවුන්ට දැනෙනු ඇත. මෙමගින් අභ්‍යන්තර ගැටුම් ඇතිවීමේ අවදානම අඩු වන අතර පශ්චාත් යුද වාතාවරණයකදී ජාතීන් අතර සහජීවනය ගොඩනැංවීමටද එය ඉවහල් වනු ඇත.

### 4. ඔබට දූෂණ වංචා පිළිබඳව හෙළිදරවු කළ හැකියි.

බොහෝ රටවල්වල දූෂිත නිලධාරීහූ මහජනතාව වෙනුවෙන් වැය කළ යුතු මුදල් ගසා කති. ආණ්ඩුවට කොතරම් මුදල් ලැබෙන්නේද, ඒවායින් කෙතරම් ප්‍රමාණයක් වියදම් කරන්නේද යන්න පිළිබඳ තොරතුරු ඔබ වෙත ලැබෙන්නේ නම් නිලධාරීන් විසින් මහජන මුදල් ගසා කන්නේද යන්න හෙළිදරවු කර ගත හැකියි. මහජනතාව වෙත සියලු තොරතුරු ලැබෙන බවත්, තමන් වියදම් කරන මුදල් පිළිබඳ ඔවුන් සෝදිසියෙන් සිටින බවත් දන්නා විට මේ නිලධාරීන් වංචා දූෂණ වලට පෙළඹීමට ඇති ඉඩ කඩ බොහෝ දුරට අඩු වනු ඇත.

### තොරතුරු නිදහසේ පනත - අතහැරුණු අවස්ථාව

තොරතුරු නිදහසේ පනතක් ශ්‍රී ලංකාවට අවශ්‍ය බවට සාකච්ජාව හරියට පටන් ගැනුනේ 1990 ගණන් මුල් භාගයේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ආරම්භයත් සමගය. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය රට පුරා ගෙන ගිය දැනුවත් කිරීමේ ව්‍යාපාරයන්හි එක් ඉලක්කයක් වූයේ මහාජනයාට ඇති තොරතුරු දැන ගැනීමේ නිදහස සහතික කර ගැනීමයි.

1994 බලයට පත් චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව විසින් පත්කළ රාජනීතිඥ ආර්.කේ.ඩබ්. ගුණසේකර කමිටුව එවැනි පනතක අවශ්‍යතාවය සිය වාර්තාවෙහි පැහැදිලිව දක්වා ඇත.

එතැන් පටන් මෙරට ජනමාධ්‍ය නිදහස සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සලකා බැලුණු සෑම අවස්ථාවකම තොරතුරු නිදහසේ නීතියක අවශ්‍යතාවය තහවුරු කෙරුණි. 1998 කොළඹ ප්‍රකශනය, 2005 ජනමාධ්‍ය ප්‍රඥප්තිය ඒ අතර වැදගත් තැනක් ගනී. යහ පාලනය උදෙසා කටයුතු කරන දෙස් විදෙස් රාජ්‍ය නොවන ක්ෂේත්‍රය ද මෙවැනි නීතියක අවශ්‍යතාවය දිගින් දිගටම අවධාරණය කරයි.

මෙම ව්‍යයාමයන් හි කූඨප්‍රාප්තිය වූයේ 2002 දී ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග එක්ව සකස් කරන ලද තොරතුරු නිදහසේ පනත ය. එම පනත එහැම පිටින්ම වාගේ එවකට තිබූ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව විසින් පිළිගන්නා ලද අතර 2003 දෙසැම්බරයේ දී ජනාධිපතිනිය ද ඇතුලු අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කරන ලදී. අනතුරුව ආණ්ඩුව විසුරුවා හැරුණි. එසේ නොවූයේ නම් පාර්ලිමේන්තුවේ ඒකඡන්දයෙන් එම පනත සම්මත වීමට අවශ්‍ය පරිසරය සැලසී තිබුණි.

මෙරට ආණ්ඩුකරණය ප්‍රජාතන්ත්‍රීයකරණයේ තීරණාත්මක කඩ ඉමක් විමට ඉරණම් තිබූ අවස්ථාවක් අප අතින් ගිලිහී ගියේ එලෙස ය. එම පනත යළි වේදිකාවට ගෙනැවිත් මහජන සම්මතය ලබා ගැනීම අප ඉදිරියේ ඇති වත්මන් අභියෝගය යි.

### 5. ඔබේ රටේ ආර්ථික සංවර්ධනයට හවුල් වෙන්න.

ආයෝජකයන් වඩාත් කැමති වන්නේ ආණ්ඩුව විසින් එහි ආර්ථික කටයුතු පිළිබඳ නිවැරදි තොරතුරු හෙළිදරවු කරන රටක තම මුදල් ආයෝජනය කිරීමටයි. එසේම තොරතුරු නිදහස ඇති විට තමන් මහජනතාවට ප්‍රයෝජනවත් ලෙස මුදල් වැය කරන බව පෙන්වීමට ආණ්ඩුවට සිදුවේ. එම මුදල් කාලීනව වඩාම අවශ්‍ය වන වැඩසටහන් වෙනුවෙන් යොදවන ලෙසත්, මුදල් නාස්තියකින් තොරව පාවිච්චි වන විකල්ප තෝරා ගන්නා ලෙසත් ඔබට ආණ්ඩුවට බලපෑම් කළ හැකියි. මේ මගින් ආණ්ඩුවට ලැබෙන මුදල් රටේ දුප්පතුන් ඇතුළුව සියලුම පුරවැසියන් ගේ යහපත වෙනුවෙන් ඵලදායී ලෙස යෙදවෙන බව සහතික කර ගත හැකියි.